JSS Journal of Social Statistics

# දරුවන්ගේ ජ්‍යෙෂ්ඨ විද්‍යාල (High School) අධ්‍යාපනය කෙරෙහි කුටුම්භ ආදායමේ බලපෑම

කේ. එම්. ඩී. එම්. තිලකරත්න[1]     ආර්. ඒ. ශයිනි සඳුනිකා

***සංක්ෂේපය***

*විවිධ වූ කුටුම්භ පාරිසරික තත්ත්වයන් යටතේ මෙන්ම විෂම මාසික ආදායම් උපයන කුටුම්භ නියෝජනය කරන දරුවන් මෙරට පාසල් තුළ තම අධ්‍යාපන කටයුතු සිදු කරයි. දැනුම, පරපුරකින් තවත් පරපුරකට සාර්ථකව සංක්‍රමණය කරගැනීමේ ක්‍රමවේදය "අධ්‍යාපනය" යි. මෙරට අධ්‍යාපන ක්‍රමය තුළ ළදරුවන් උදෙසා පෙර පාසල්, බාල දරුවන් උදෙසා ප්‍රාථමික පාසල් සහ ප්‍රාථමික අධ්‍යාපනය අවසන් කළ නව යොවුන් පිරිස් වෙනුවෙන් ද්විතීයික පාසල් පවතී. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු වාර්තාවලට අනුව පවුලක මධ්‍යන්‍යය කුටුම්භ මාසික ආදායම රු: 62,237කි. වියදම රු: 54,999 කි. කුටුම්භ ආදායමේ විෂමතාවයන් දරුවන්ගේ ජ්‍යෙෂ්ඨ විද්‍යාල (High School) අධ්‍යාපනය කෙරෙහි සෘජුවම බලපෑමක් එල්ල කරන්නේ ද යන්න සොයා බැලීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ විය. සසම්භාවී නියැදුම් ක්‍රමය යටතේ දෙපිය පොකුරු නියැදීම මඟින් සිසුන් 80 ක නියැදියක් ආශ්‍රයෙන් ප්‍රාථමික දත්ත රැස් කර ඇත. ද්විතියික දත්ත රැස් කිරීමේදී ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මඟින් ප්‍රකාශයට පත් කරන ලද වාර්තා යොදා ගෙන ඇත. දත්ත විශ්ලේෂණයේදී ප්‍රතිපායන විශ්ලේෂණය, කයි වර්ග පරීක්ෂාව යන සංඛ්‍යාන ක්‍රම ශිල්ප භාවිතා කොට ඇත. කයි වර්ග පරීක්ෂාවට අනුව දරුවන්ගේ අධ්‍යාපනික සාධනය කෙරෙහි කුටුම්භ ආදායම් ප්‍රමාණය බලපෑමක් එල්ල කරන බව තහවුරු විය. තමාගේ අධ්‍යාපන කටයුතු සඳහා දෙමාපියන්ගෙන් ලැබෙන සහයෝගය ප්‍රමාණවත් යැයි සිසුන් 92.5% ක ප්‍රමාණයක් පවසන අතර තම අධ්‍යාපන කටයුතු සඳහා දෙමාපියන්ගෙන් ලැබෙන සහයෝගය ප්‍රමාණවත් නොවන බව සිසුන් 5% ක ප්‍රමාණයක් පවසයි. සරල ප්‍රතිපායන විශ්ලේෂණය හරහා කුටුම්භයක් විසින් අධ්‍යාපනික කටයුතු සඳහා දැරිය යුතු මාසික මධ්‍යන්‍ය වියදම සපුරන පවුල් 59 % බව ගම්‍ය විය. දරුවන්ගේ අධ්‍යාපනික සාධනය කෙරෙහි කුටුම්භ ආදායම් ව්‍යාප්තිය සෘජුවම මෙන්ම වක්‍රාකාරයෙක්ද බලපෑම් කරන බව තහවුරු විය.*

***මුඛ්‍ය පද : අධ්‍යාපනය, කුටුම්භ ආදායම්, දෙමාපියන්, ජ්‍යෙෂ්ඨ විද්‍යාල, සිසුන්***

## 1. හැඳින්වීම

විවිධ වූ කුටුම්භ පාරිසරික තත්වයන් යටතේ මෙන්ම විෂම මාසික ආදායම් උපයන කුටුම්භ නියෝජනය කරන දරුවන් මෙරට පාසල් තුළ තම අධ්‍යාපන කටයුතු සිදු කරයි. දැනුම යනු සජීවි දෙයකි. මේ සජීවී දැනුම පරපුරකින් තවත් පරපුරකට සාර්ථකව සංක්‍රමණය කරගැනීමේ ක්‍රමවේදය "අධ්‍යාපනය" යි. මෙරට අධ්‍යාපන ක්‍රමය තුළ ළදරුවන් උදෙසා පෙර පාසල්,

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
dineshmadusankat@gmail.com

බාල දරුවන් උදෙසා ප්‍රාථමික පාසල් සහ ප්‍රාථමික අධ්‍යාපනය අවසන් කළ නව යොවුන් පිරිස් වෙනුවෙන් ද්විතීයික පාසල් පවතී. උසස් අධ්‍යාපන පාඨමාලා පවත්වන ආයතන පොදුවේ විශ්වවිද්‍යාල යනුවෙන් හැඳින්වේ.

රූප සටහන 1. අධ්‍යාපනය වර්ගීකරණය




මූලාශ්‍රය : අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව (2016)

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2016/2017 ගෘහස්ත ආදායම් හා වියදම් සමීක්ෂණයට අනුව සිව් දෙනෙකුගෙන් යුත් පවුලක වියදම රුපියල් 54,999 ක් බවට ගණනය කරනු ලැබ තිබේ. මධ්‍යන්‍යය කටුම්භ මාසික ආදායම වන්නේ, රුපියල් 62,237 කි.

කුටුම්භ ආදායමේ විෂමතාවයන් සහ කුටුම්භ පාරිසරික තත්වයන් දරුවන්ගේ ද්විතීක අධ්‍යාපනය කෙරෙහි ඍජුවම බලපෑමක් එල්ල කරයි ද යන්න මෙම පර්යේෂණයේ ගැටලුව වේ.

කුටුම්භ ආදායම් ප්‍රමාණය දරුවන්ගේ ජ්‍යෙෂ්ඨ විද්‍යාල (High School) අධ්‍යාපනය කෙරෙහි ඍජුවම බලපෑමක් එල්ල කරන්නේ ද යන්න සොයා බැලීම, අධ්‍යාපන කටයුතු සඳහා දෙමාපියන්ගෙන් ලැබෙන සහයෝගයේ ස්වභාවය කෙබඳු දැයි විමසා බැලීම සහ දරුවන්ගේ ද්විතීක අධ්‍යාපනය කෙරෙහි බලපෑම් එල්ල කරන අනෙකුත් සාධක මොනවාද යන්න සොයා බැලීම මෙම පර්යේෂණයේ අරමුණු කොට ගැනිණි.

## 2. දත්ත රැස් කිරීම හා පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා නියැදිය තෝරා ගැනීමේදී සසම්භාවී නියැදුම් ක්‍රමය යටතේ පොකුරු නියැදීම (දෙපිය පොකුරු නියැදීම) මඟින් සිසුන් 80 ක නියැදියක් තෝරා ගෙන ඇත. ප්‍රාථමික දත්ත රැස් කිරීමේදී ප්‍රශ්නාවලී ක්‍රමය යොදා ගත් අතර ද්විතියික දත්ත රැස් කිරීමේදී ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මඟින් ප්‍රකාශයට පත් කරන ලද වාර්තාද යොදා ගෙන ඇත. දත්ත සැකසීමේදී IBM SPSS මෘදුකාංගය හා Microsoft Excel 2016 මෘදුකාංගය යොදා ගෙන ඇත. දත්ත විශ්ලේෂණයේ දී ප්‍රතිපායන විශ්ලේෂණය, කයි වර්ග පරීක්ෂාව යන සංඛ්‍යාන ක්‍රම ශිල්ප භාවිතා කොට ඇත. තව ද දත්ත ඉදිරිපත් කිරීමේ දී ප්‍රස්තාර හා වගු යොදා ගෙන ඇත.

බස්නාහිර සහ සබරගමුව යන පළාත් දෙකට පමණක් සීමා වී දත්ත රැස් කිරීම සහ ජ්‍යෙෂ්ඨ විද්‍යාල සිසුන්ගෙන් පමණක් නියැදිය තෝරා ගැනීම මෙම පර්යේෂණයේ සීමාවන් ලෙස දැක්විය හැක.

## 3. දත්ත විශ්ලේෂණය

### *3.1. දරුවන්ගේ අධ්‍යාපනික සාධනය කෙරෙහි කුටුම්භ ආදායම් ප්‍රමාණය බලපෑමක් එල්ල කරයි ද යන්න විමසා බැලීම.*

$H_0$ - දරුවන්ගේ අධ්‍යාපනික සාධනය කෙරෙහි කුටුම්භ ආදායම් ප්‍රමාණය බලපෑමක් එල්ල නොකරයි.

$H_1$ - දරුවන්ගේ අධ්‍යාපනික සාධනය කෙරෙහි කුටුම්භ ආදායම් ප්‍රමාණය බලපෑමක් එල්ල කරයි.

කයි වර්ග පරීක්ෂාවට අනුව (ඇමුණුම 1) $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප වේ. ඒ අනුව දරුවන්ගේ අධ්‍යාපනික සාධනය කෙරෙහි කුටුම්භ ආදායම් ප්‍රමාණය බලපෑමක් එල්ල කරන බව තහවුරු වේ.

### *3.2. අධ්‍යාපන කටයුතු සඳහා දෙමාපියන්ගෙන් ලැබෙන සහයෝගයේ ස්වභාවය කෙබඳු දැයි විමසා බැලීම.*

රූප සටහන 2. අධ්‍යාපන කටයුතු සඳහා දෙමාපියන්ගෙන් ලැබෙන සහයෝගය




මූලාශ්‍රය : නියැදි සමීක්ෂණය (2018)

තමාගේ අධ්‍යාපන කටයුතු සඳහා දෙමාපියන්ගෙන් ලැබෙන සහයෝගය ප්‍රමාණවත් යැයි 92.5% ළමුන් පිරිසක් පවසන අතර තම අධ්‍යාපන කටයුතු සඳහා දෙමාපියන්ගෙන් ලැබෙන සහයෝගය ප්‍රමාණවත් නොවන බව පවසන්නේ සිසුන් 5% ක ප්‍රමාණයකි.

### *3.3. අධ්‍යයන කටයුතු සඳහා මාසිකව වෙන් කළ යුතු මුදල් ප්‍රමාණය කොපමණ දැයි විමසා බැලීම.*

පවුලක සිටින අධ්‍යාපනය හදාරණ සිසුන් හට කොපමණ මුදලක් වෙන් කළ යුතුද යන්න විමසා බැලීමට, පවුලක සිටින අධ්‍යාපනය හදාරණ සිසුන් ගණන හා ඔවුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා මසකට වෙන් කරන මුදල් ප්‍රමාණය මත ප්‍රතිපායන විශ්ලේෂණය සිදු කරන ලදී (ඇමුණුම 2).

අධ්‍යයන කටයුතු සඳහා වියදම් = 5690.423 - 375.246 (පවුලක සිටින සිසුන් ගණන)
පවුලක සිටින අධ්‍යාපනය හදාරණ මධ්‍යන්‍ය සිසුන් ගණන = 2 කි
අධ්‍යයන කටයුතු සඳහා වියදම් = 5690.423 - 375.246 × 2
= 4939.931

මෙම අධ්‍යයනය තුළදී සලකා ලද නියැදියට අනුව පවුලක සිටින අධ්‍යාපනය හදාරන මධ්‍යන්‍ය සිසුන් ගණන දෙදෙනෙකි. ඒ අනුව දරුවන් දෙදෙනෙකු සිටින පවුලක අධ්‍යයන කටයුතු සඳහා මාසිකව වෙන් කළ යුතු අවම මුදල් ප්‍රමාණය රුපියල් 4940 කි.

රූප සටහන 3. අධ්‍යයන කටයුතු සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණය සපුරාලන පවුල්




මූලාශ්‍රය : නියැදි සමීක්ෂණය (2018)

නමුදු එම අවම මුදල් ප්‍රමාණය සපුරාලන පවුල් 58.75% කි. 41.25% පවුල් ප්‍රමාණයක් එම අවම මුදල තම දරුවන්ගේ අධ්‍යාපනික කටයුතු සඳහා වෙන් කිරීමට අසමත් වේ.

### *3.4. පියාගේ අධ්‍යාපන මට්ටම සහ දරුවන්ගේ අධ්‍යාපනයේ සාධනික තත්වය විමසා බැලීම.*

$H_0$ - දරුවන්ගේ අධ්‍යාපනික සාධනය කෙරෙහි පියාගේ අධ්‍යාපන මට්ටම බලපෑමක් එල්ල නොකරයි.

$H_1$ - දරුවන්ගේ අධ්‍යාපනික සාධනය කෙරෙහි පියාගේ අධ්‍යාපන මට්ටම බලපෑමක් එල්ල කරයි.

මෙහිදී $H_0$ කල්පිතය පිළිගනී (ඇමුණුම 3). ඒ අනුව ගම්‍ය වන්නේ දරුවන්ගේ අධ්‍යාපනික සාධනය කෙරෙහි පියාගේ අධ්‍යාපන මට්ටම බලපෑමක් එල්ල නොකරන බවයි.

### *3.5. මවගේ අධ්‍යාපන මට්ටම සහ දරුවන්ගේ අධ්‍යාපනයේ සාධනික තත්වය විමසා බැලීම.*

$H_0$ - දරුවන්ගේ අධ්‍යාපනික සාධනය කෙරෙහි මවගේ අධ්‍යාපන මට්ටම බලපෑමක් එල්ල නොකරයි.

$H_1$ - දරුවන්ගේ අධ්‍යාපනික සාධනය කෙරෙහි මවගේ අධ්‍යාපන මට්ටම බලපෑමක් එල්ල කරයි.

මෙහිදී $H_0$ කල්පිතය පිළිගනී (ඇමුණුම 4). ඒ අනුව ගම්‍ය වන්නේ දරුවන්ගේ අධ්‍යාපනික සාධනය කෙරෙහි මවගේ අධ්‍යාපන මට්ටම බලපෑමක් එල්ල නොකරන බවයි.

## 3.6. අධ්‍යාපන කටයුතු උදෙසා දරුවන් සඳහා වෙන්වූ භෞතික පහසුකම්

රූප සටහන 4. අධ්‍යාපන කටයුතු සඳහා වෙන් වූ ස්ථානයක්




මූලාශ්‍රය : නියැදි සමීක්ෂණය (2018)

මෙම ප්‍රස්තාර සටහනට අනුව පෙනී යන්නේ 90% ක සිසුන් ප්‍රමාණයකට තම අධ්‍යාපන කටයුතු සිදු කර ගෙන යාම සඳහා වෙන් වූ ස්ථානයක් පවතින බවයි.

රූප සටහන 5. අධ්‍යාපන කටයුතු සඳහා වෙන් වූ ස්ථානයක්




මූලාශ්‍රය : නියැදි සමීක්ෂණය (2018)

මෙයින් පෙනී යන්නේ තම අධ්‍යාපන කටයුතු සඳහා වෙන් වූ ස්ථානයක් තිබුණද තම අධ්‍යාපනික සාර්ථකත්වය කරා ළඟා වෙන්නේ 50% ආසන්න සිසුන් ප්‍රමාණයක් බවයි.

## 4. සමාලෝචනය

කුටුම්භ ආදායමේ විෂමතාවයන් දරුවන්ගේ ජ්‍යෙෂ්ඨ විද්‍යාල (High School) අධ්‍යාපනය කෙරෙහි ඍජුවම බලපෑමක් එල්ල කරන්නේ ද යන්න විමසා බැලීම ප්‍රධාන අරමුණ කොට ගෙන සිදු කරන ලද මෙම පර්යේෂණයේදී කුටුම්භ ආදායම් ප්‍රමාණය අධ්‍යාපන සාර්ථකත්වය කෙරෙහි බලපෑමක් සිදු කරන බව තහවුරු විය. දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා දෙමාපියන්ගෙන් 92.5% ක පිරිසක් ප්‍රමාණවත් සහයෝගයක් ලබා දෙන අතර 5% ක දෙමාපියන් පිරිසක් පමණක් සැලකිය යුතු සහයෝගයක් දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා ලබා නොදෙයි. තවද දරුවන් දෙදෙනෙකු සිටින පවුලක අධ්‍යයන කටයුතු සඳහා මාසිකව වෙන් කළ යුතු අවම මුදල් ප්‍රමාණය රුපියල් 4940.00 ක් බව මෙහිදී අනාවරණය කර ගැනීමට හැකි විය. දරුවන්ගේ අධ්‍යාපනික සාධනය කෙරෙහි දෙමාපියන්ගේ අධ්‍යාපන මට්ටම බලපෑමක් එල්ල කරයි. නිවස තුළ අධ්‍යාපන කටයුතු සඳහා වෙන් වූ ස්ථානයක් තිබුණද තම අධ්‍යාපනික සාර්ථකත්වය කරා ළඟා වෙන්නේ 50% ආසන්න සිසුන් පිරිසකි. ඒ අනුව දරුවන්ගේ අධ්‍යාපනික සාධනය කෙරෙහි කුටුම්භ ආදායම් ව්‍යාප්තිය ඍජුවම මෙන්ම වක්‍රාකාරයෙක්ද බලපෑම් කරන බව තහවුරු විය. අඩු ආදායම් ලාභී පවුල් වෙත මූල්‍යමය සහනාධාර ලබා දිම තුළින් හෝ අඩු ආදායම් ලාභී පවුල්  තුළ සිටින ද්විතික අධ්‍යාපනය හදාරණ සිසුන් හට ශිෂ්‍යාධාර ලබා දීම තුළින් දරුවන්ගේ අධ්‍යාපනික සාධනය ඉහළ නැංවිය හැකි බව යෝජනා කරමු.

### ආශ්‍රිත ග්‍රන්ථ


ඒකනායක, එස්. බී. (2017). අධ්‍යාපනයට අවශ්‍ය නව ප්‍රවණතා. ලබා ගැනීම: https://goo.gl/6NieM1

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු වාර්තාව. (2018). ගෘහස්ථ ආදායම් හා වියදම් සමීක්ෂණය 2016. ලබා ගැනීම: https://goo.gl/EmYnc7

සමීර, ඩී. (2017). ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය. ලබා ගැනීම: https://goo.gl/5Yr8Xy

Wijemanne, E. L. (2016). Educational Reforms in Sri Lanka, Issue 70.

**ඇමුණුම්**

ඇමුණුම 1. කයි වර්ග පරීක්ෂාව - දරුවන්ගේ අධ්‍යාපනික සාධනය හා කුටුම්භ ආදායම් ප්‍රමාණය

| | Value | df | Asymp. Sig. (2-sided) |
|---|---|---|---|
| Pearson Chi-Square | 5.896[a] | 6 | .004 |
| Likelihood Ratio | 6.144 | 6 | .407 |
| Linear-by-Linear Association | 2.863 | 1 | .091 |
| N of Valid Cases | 80 | | |

මූලාශ්‍රය : නියැදි සමීක්ෂණය (2018)

ඇමුණුම 2. ප්‍රතිපායන විශ්ලේෂණය

| Model | | Coefficients[a] Unstandardized Coefficients B | Std. Error | Standardized Coefficients Beta | t | Sig. |
|---|---|---|---|---|---|---|
| 1 | (Constant) | 5690.423 | 1011.249 | | 5.627 | .000 |
| | Students in family | -375.246 | 417.266 | -.102 | -.899 | .371 |

a. Dependent Variable: Expenditure for studies

මූලාශ්‍රය : නියැදි සමීක්ෂණය (2018)

ඇමුණුම 3. කයි වර්ග පරීක්ෂාව

Chi-Square Tests

| | Value | df | Asymp. Sig. (2-sided) |
|---|---|---|---|
| Pearson Chi-Square | 15.188[a] | 12 | .231 |
| Likelihood Ratio | 16.881 | 12 | .154 |
| N of Valid Cases | 80 | | |

මූලාශ්‍රය : නියැදි සමීක්ෂණය (2018)

ඇමුණුම 4. කයි වර්ග පරීක්ෂාව

| Chi-Square Tests | | | |
|---|---|---|---|
| | Value | df | Asymp. Sig. (2-sided) |
| Pearson Chi-Square | 14.638[a] | 12 | .262 |
| Likelihood Ratio | 14.981 | 12 | .242 |
| N of Valid Cases | 80 | | |

මූලාශ්‍රය : නියැදි සමීක්ෂණය (2018)